L

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2018/07/18 |
| --- | --- | --- |

පැමිණිලිකරු : බී.ඒ.යූ.ඒ. බෝගොඩ මයා,
නො. 29 2/1, මාලිගාකන්ද පාර,
කොළඹ 10.

වගඋත්තරකරුවන් : 01. විදුහල්පති,
ආනන්ද විද්‍යාලය,
කොළඹ 10.

02. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

<u>පැමිණිලි අංකය : **HRC/151/18**</u>

ඉහත පැමිණිල්ලට අදාළව 2018.07.05 දිනැති නිකුත් කර ඇති නිර්දේශය හා බැඳේ.

එකී නිර්දේශයේ දෙවන පිටුවේ "පැමිණිලිකරු ආසන්නතා පදනම මත අංක ***CO 19*** යටතේ" ලෙස සඳහන්ව ඇති අතර එය "පැමිණිලිකරු ආසන්නතා පදනම මත අංක ***<u>CO 319</u>*** යටතේ" ලෙසට නිවැරදි විය යුතු බව මෙයින් දන්වා සිටිමි.

තවද එහි තුන්වන පිටුවේ අවසන් ඡේදයේ "ඔප්පුව සඳහා ලකුණු 03ක්ද" ලෙස සටහන්ව ඇති අතර. එය " ඔප්පුව සඳහා <u>ලකුණු 0.3 ක්ද"</u> ලෙස නිවැරදි විය යුතු බවද දන්වා සිටිමි.

මේ හේතුවෙන් ඔබට යම් අපහසුතාවයක් වූයේ නම් ඒ සම්බන්ධයෙන් කණගාටුව ප්‍රකාශ කරමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :- 1. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

B/


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580/81/82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ක්ෂනික / துரித அழைப்பு / Hotline: 011-2505575 / 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

Article 12(1).

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2018/07/05

පැමිණිලිකරු : බී.ජ්.යූ.ජ්. බෝගොඩ මයා.
නො. 29 2/1. මාලිගාකන්ද පාර.
කොළඹ 10.

වගඋත්තරකරුවන් : 01. විදුහල්පති.
ආනන්ද විද්‍යාලය.
කොළඹ 10.

02. ලේකම්.
අධ්‍යාපන අමාත්‍යාංශය.
ඉසුරුපාය. බත්තරමුල්ල.

<u>පැමිණිලි අංකය</u> : **<u>HRC/151/18</u>**

ඉහත පැමිණිලිකරු විසින් 2018-01-11 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ල ගොනු කරමින් සඳහන් කර ඇත්තේ. තම දරුවා වන බී.ජ්. ඔමිදු රන්සන බෝගොඩ දරුවා වගඋත්තරකාර විද්‍යාලයේ 2018 වසරේ පළමු ශ්‍රේණියට ඇතුලත් කිරීමට අයදුම්කල බවත්. සම්මුඛ පරීක්ෂණයට තුන් වතාවක් කැඳවූ නමුත් ලකුණු ලබා නොදුන් බවත්. ඉන්පසු අභියාචන ඉදිරිපත් කිරිමෙන් පසු අභියාචනා මණ්ඩලයේදී ආසන්නතාවයට දෙනු ලබන ලකුණු 50 හැර ජන්ද හිමි නාම ලේඛනයට හා අනෙකුත් ලේඛන වලට ලකුණු ලබා දී ඇති බවත්ය. බදු ඔප්පුව අවුරුදු 05ක කාලයක් නොමැති බවට පවසා ආසන්නතාවයට ලබා දෙන ලකුණු 50 අහිමි කර ඇති බවත්. පාසලට ළමුන් ඇතුලත් කර ගැනිමේ අවම ලකුණු සීමාව ලකුණු 71ක් වන අතර. තමාට ලකුණු 77.5ක් හිමිවිය යුතු නමුත් වගඋත්තරකාර විදුහල්පතිවරයා සහ අභියාචනා මණ්ඩලයේ සභාපතිවරයා තමාට හිමි ලකුණු ලබා නොදිම තුලින් තම දරුවා පාසලට ඇතුලත් කර ගැනිමට නොහැකි වූ බව පැමිණිලිකරු සිය පැමිණිල්ල මගින් කියාසිට ඇත. ඒ අනුව



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
දුරකථන
ලේකම්
ක්ෂණික
වෙබ්

පාසලට ඇතුලත් වීමට අවශ්‍ය ලකුණු ප්‍රමාණය උපයාගෙනඇති තමාගේ දරුවා පාසලට තෝරා නොගැනීම හේතුවෙන් තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බව පැමිණිලිකරු විසින් සඳහන් කොට ඇත.

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-

ඉහත පැමිණිල්ල සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීමට වගඋත්තරකාර විදුහල්පති ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට පහත දිනයන් හි පරීක්ෂණ සඳහා කැඳවා ඇත.

2018.02.16 වන දින පෙ.ව. 10.30ටද.

2018.03.09 වන දින ප.ව.1.30ට හා

2018.04.20 වන දින පෙ.ව.11.00ට

නමුත්. පළමු වගඋත්තරකාර පාර්ශවය හේතු දැක්වීමකින් තොරව කොමිෂන් සභාව හමුවේ පෙනී සිට නොමැත.

දෙවන වගඋත්තරකාර අධ්‍යාපන ලේකම් වෙනුවෙන් නිතිඥ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ පී.ඒ.ඩී.පී. නිශාන්ත මහතා කොමිෂන් සභාව හමුවේ පෙනී සිටිමින් සඳහන් කර ඇත්තේ මේ සියළු තොරතුරු විදුහල්පතිවරයා සතු වන බැවින්. දෙවන වගඋත්තරකාර පාර්ශවයට මේ සම්බන්ධයෙන් කරුණු දැක්වීමට අපහසු බවයි.

කොමිෂන් සභාව හමුවේ අනාවරණය වී ඇති කරුණු :-

පැමිණිලිකරු ආසන්නතා පදනම මත අංක CO 19 යටතේ සම්මුඛ පරීක්ෂණයට අවස්ථා දෙකකදී සහභාගි වී ඇති බවත්. අභියාචනයේදී ආසන්නාවයට ලැබෙන ලකුණු 50 පැමිණිලිකරුගේ බදු ඔප්පුව අවුරුදු 05ක් නොමැති වීම හේතුවෙන් ලබා දී නොමැති බවත් නිරීක්ෂණය වේ.

මෙහිදී ආසන්නතා පදනම මත පළමු ශ්‍රේණියට ළමුන් ඇතුලත් කිරීම සඳහා ඉදිරිපත් කරන ලේඛන පිළිබඳ සැළකීමේදී 2018 වසරේ පළමුවන ශ්‍රේණියට ළමුන් ඇතුලත් කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම්වරයා විසින් නිකුත් කර ඇති 2017.05.30 දිනැති හා අංක 22/2017 දරණ චක්‍රලේඛනයේ 7.1.3 වගන්තිය අනුව *"මෙම ගණ සඳහා ලකුණු ක්‍රමයකට අනුව ලකුණු ලබාදෙන හෙයින් ලකුණු ලබා දීමේ පටිපාටියේ එක් කොටසකට ලකුණු ලබා නොගත්තද. ලකුණු හිමිවන අනෙකුත් කොටස් සඳහා ලකුණු ලබාදිය යුතු අතර. එවැනි අවස්ථාවල එම ගණය සඳහා සම්පූර්ණයෙන්ම ලකුණු ලබා දීම ප්‍රතික්ෂේප නොකළ යුතුය"* වශයෙන් දක්වා ඇත.

කෙසේ වෙතත්, නැවතත් 2017.07.01 දිනැතිව අංක 22/2017 (1) චක්‍රලේඛය අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම්වරයා විසින් සියලුම පාසල් විදුහල්පතිවරුන් වෙත නිකුත් කර ඇති අතර, එම චක්‍රලේඛය අනුව ඉහත කී 22/2017 චක්‍රලේඛයේ 7.1.3 උප වගන්තිය සම්පූර්ණයෙන්ම ඉවත් කර ඇති බවට දක්වා තිබීම හේතුවෙන් පැමිණිලිකරු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් වූ අවස්ථාව වනවිට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පැමිණිලිකරුගේ අයදුම්පත්‍රය සම්පූර්ණයෙන්ම ඉවත් කිරීමට නීතියෙන් අවස්ථාවක් ලැබී තිබූ බවට නිරීක්ෂණය වුවද අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම්වරයා විසින් 2017.09.19 වන දින සියලුම පාසැල් වල විදුහල්පතිවරුන් වෙත නිකුත් කර ඇති ලිපියෙහි දෙවන ඡේදය කෙරෙහි අවධානය යොමු කිරීමේදී "පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීමට අදාළ 2017.05.30 දිනැති 22/2017 චක්‍රලේඛය සම්බන්ධයෙන් විවිධ පාර්ශව වලින් තවදුරටත් ඉදිරිපත් වූ අදහස් හා යෝජනා අනුව 22/2017 (1) චක්‍රලේඛනය මගින් සංශෝධනය සිදුකර ඇත. මෙම සංශෝධනය අනුව චක්‍රලේඛයේ 7.1.3 උප වගන්තිය ඉවත් කර ඇතත්, එක් එක් ගණයක් යටතේ නිර්නායකයන්ට හිමිවන ලකුණු සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කළ යුතුය යන්න එමගින් ගම්‍ය නොවේ." වශයෙන් දක්වා ඇත. තවද එම ලිපියේ 3 වන ඡේදයට අනුව "22/2017 චක්‍රලේඛනයේ අදාළ ගණයන් හය සඳහා මූලික සුදුසුකම් හඳුන්වා දීමෙන් අනතුරුව ඒ ඒ ගණයට අදාළ ලකුණු පටිපාටිය දක්වා ඇත. යම් අයදුම්කරුවෙකු එම මූලික සුදුසුකම් සපුරා නොමැති නම් පමණක් අදාළ ගණයට හිමිකම නොලබයි. එහෙත් නියමිත මූලික සුදුසුකම් සපුරා ඇත්නම් ලකුණු පටිපාටියේ එක් එක් කොටසක් තහවුරු නොකිරීම මත සම්පූර්ණයෙන් ලකුණු ලබාදීම ප්‍රතික්ෂේප නොකළ යුතුය" යනුවෙන් දක්වා ඇත. පැමිණිලිකරු ආසන්නතා පදනම මත මූලික සුදුසුකම් සපුරා ඇත.

"22/2017 චක්‍ර ලේඛයේ අදාළ ගණයන් සඳහා මූලික සුදුසුකම් හඳුන්වා දීමෙන් අනතුරුව ඒ ඒ ගණයට අදාළ ලකුණු පටිපාටිය දක්වා ඇත. යම් අයදුම්කරුවෙකු එම මූලික සුදුසුකම් සපුරා නොමැති නම් පමණක් අදාළ ගණයට හිමිකම නොලබයි. එහෙත් නියමිත මූලික සුදුසකම් සපුරා ඇත්නම් ලකුණු පටිපාටියේ එක් කොටසක් තහවුරු නොකිරීම මත සම්පූර්ණ ලකුණු ලබාදීම ප්‍රතිසෙෂ්ප නොකළ යුතු බව" දන්වා ඇත.

එසේම විශේෂයෙන්ම පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ දරුවන්ගේ ගණය යටතේ මූලික සුදුසුකම වනුයේ පෝෂිත ප්‍රදේශය තුළ පදිංචි වී සිටීමය. පදිංචිය තහවුරු කරන ලේඛන යටතේ වන පදිංචි ස්ථානයේ හිමිකම යන්න ලකුණු පටිපාටියේ අන්තර්ගත එක් නිර්නායකයක් පමණක් බවත් දක්වා ඇත.

ඒ අනුව පැමිණිලිකරු ආසන්නතා පදනම මත ඉල්ලුම් කර ඇති අතර, පැමිණිලිකරුට ඡන්ද හිමි නාම ලේඛනයට ලකුණු 24ක්ද, ඔප්පුව සඳහා ලකුණු 03ක්ද හා අතිරේක ලේඛන සඳහා ලකුණු

2.75 හිමි කර ඇති බව රාජකීය විද්‍යාලය සම්මුඛ පරීක්‍ෂණයේදී ලබා දුන් ලකුණු අනුව නිරීක්‍ෂණය වේ. එසේම ආනන්ද විද්‍යාලයට ආසන්නතාවයට හිමි වන ලකුණු 50 පැමිණිලිකරුට ලබා නොදීමට හේතු ඇති බවක් නිරීක්ෂණය නොවේ. ඒ අනුව පැමිණිලිකරු මෙම විද්‍යාලයේ සම්මුඛ පරීක්ෂණයට/අභියාචනයට සහභාගී වී මූලික සුදුසුකම් මත ලකුණු ලැබීමට හිමිකමක් ඇති බව නිරීක්ෂණය වේ.

ආසන්නතා ගණයේ චක්‍රලේඛන තුළ ඉතා නිවැරදිව අර්ථකථනය කොට ඇති අතර. ආසන්නතාවය යටතේ දරුවන් ඇතුලත් කර ගත යුත්තේ කුමන ආකාරයෙන්ද යන්න නිවැරදිව දක්වා ඇත. චක්‍ර ලේඛයේ ඇතුලත් නිර්නායකයන් යටතේ ඉතා නිවැරදිව ආසන්න පදිංචිකරුවන් කවුරුන්ද යන්න හඳුනා ගැනීමට නිත්‍යානුකූල හැකියාව තිබියදීත් සම්මුඛ පරීක්‍ෂණ මණ්ඩලය හා අභියාචනා මණ්ඩලය මෙම පැමිණිලිකරු පිළිබඳව සලකා බලා නොමැති බව නිරීක්‍ෂණය වේ.

එසේම මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ පැවැති විමර්ශනයේදී කරුණු දැක්වීමට අදාලව වගඋත්තරකාර පාර්ශවය ඉදිරිපත් නොවීම තුලින් මානව හිමිකම් කොමිෂන් සභාව ඒකපාර්ශවික නිර්දේශයක් යොමු කිරීමට තිරණය කර ඇත.

නිගමනය :-

වගඋත්තරකාර පාර්ශවය අදාල චක්‍රලේඛන ප්‍රකාරව කටයුතු නොකර අත්තනෝමතික ක්‍රමවේදයක් අනුගමනය කිරීම තුලින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

1. ඒ අනුව පැමිණිලිකරුගේ දරුවා බී.ජී. ඔමිදු රන්සත බෝගොඩ දරුවා වගඋත්තරකාර විද්‍යාලයේ 2018 වර්ෂයේ පළමු ශ්‍රේණියට ඇතුලත් කර ගැනීමට අදාලව ලකුණු ලබා දීම සිදුකල යුතු බවත්. ඒ අනුව පැමිණිලිකරු කඩඉම් ලකුණු සීමාව කරා ප්‍රවිශ්ඨ වන්නේ නම් පැමිණිලිකරුගේ දරුවා 2018 වර්ෂයේ පළමු ශ්‍රේණියට ඇතුලත් කර ගැනීමට කටයුතු කලයුතු බවත්. මෙයින් නිර්දේශ කරන අතර. එම ලකුණු ලබාදීම අධ්‍යාපන අමාත්‍යංශය හා එක්ව සිදුකර සති 02 ක කාලයක් තුළ එනම් 2018.07.20 දිනට පෙර සිදුකර ඒ සම්බන්ධයෙන් කොමිෂන් සභාවට වාර්තා කළ යුතු බවට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා

මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

2. එසේම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ පැවති පරීක්ෂණයන් සඳහා හේතු දැක්වීමකින් තොරව පැමිණීම පැහැර හැර තිබීම මත 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 20(3) 21(3) වගන්ති ප්‍රකාරව ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දඩුවම් කරනු ලැබිය හැකි අපහාස වරදක් සංයුක්ත වීම මත මේ පිළිබඳ 1996 අංක 21 දරණ මානව හිමිකම් පනතේ 21(4) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත වාර්තා කිරීමට පෙර පලවන වගඋත්තරකාර පාර්ශවය විසින් ඒ සම්බන්ධයෙන් නිදහසට කරුණු දැක්වීම 2018. 07 .20 වන දිනට පෙර කළ යුතු බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර. එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. N. D. Udagam
Chairperson
Human Rights Commission of Sri Lan

පිටපත :- ලේකම්.
අධ්‍යාපන අමාත්‍යංශය.
ඉසුරුපාය. බත්තරමුල්ල.

B/